ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
|---|---|
| දිනය | 2018 පෙබරවාරි 15 |

## මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාව ලැයිස්තුගත කිරීම සහ ගෝලීය වශයෙන් පවතින මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුතීන් වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස කටයුතු කරනු ලබන මූල්‍ය කාර්ය සාධක බලකාය (Financial Action Task Force - FATF) විසින් මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ගෝලීය වශයෙන් සිදුවන වෙනත් අදාළ වැරදි වැළැක්වීම සඳහා නිර්දේශ 40ක් හඳුන්වා දී ඇත. මූල්‍ය කාර්ය සාධක බලකායට අනුබද්ධිත කලාපීය සංවිධානයක් ලෙස මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (Asia Pacific Group on Money Laundering – APG) කටයුතු කරනු ලබන අතර, මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශයන්ට කලාපය තුළ ඇති අනුකූලතාවය ඔවුන් විසින් නිරීක්ෂණය කරනු ලබයි. තවද, ශ්‍රී ලංකාව, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ ආරම්භක සාමාජිකයෙක් වේ.

එක් එක් රටවල නීතිමය හා ආයතනික රාමුව සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා එම රටවල් විසින් ක්‍රියාවට නංවා ඇති පියවර පිළිබඳව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින්, කලාපීය නිරීක්ෂණ ආයතන හරහා නිරන්තරයෙන් ඇගයීමට ලක් කරනු ලබයි. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කාලපීය කණ්ඩායම මගින් 2006 වසරේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ පළමු අන්‍යොන්‍ය ඇගයීමද, 2014/15 වසරවලදී දෙවන අන්‍යොන්‍ය ඇගයීම ද සිදුකරන ලදී. 2015 ජූලි මාසයේදී දෙවන අන්‍යොන්‍ය ඇගයීම් වාර්තාව සම්මත වූ අතර, අන්‍යොන්‍ය ඇගයීමේදී හඳුනාගත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම

මැඩපැවැත්වීමේ ඇති දුර්වලතාවයන් මඟ හරවා ගැනීම සඳහා ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නැංවිය යුතු පියවර රැසක් මෙහිදී නිර්දේශ කරන ලදී.

අනතුරුව, මෙම දුර්වලතාවයන් මඟ හරවා ගැනීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික ප්‍රතිපත්තිය සම්මත කර ගැනීම, මූල්‍ය ආයතන ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ රීති සහ අවදානම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණ ක්‍රමවේදයක් මූල්‍ය ආයතනයන්ට හඳුන්වා දීම ආදිය ඇතුළත් පියවර රැසක් ශ්‍රී ලංකාව විසින් ක්‍රියාවට නංවන ලදී. මේ අතර, අන්‍යෝන්‍ය ඇගයීමේදී හඳුනාගත් දුර්වලතා මඟ හරවා ගැනීමට එක් එක් ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරී සැලැස්මක්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව සම්මත කර ගන්නා ලදී. ශ්‍රී ලංකාව පෙන්වා ඇති ප්‍රගතිය පදනම් කරගෙන පළමුව "තරමක් දුරට අනුකූල" ලෙස ශ්‍රේණිගත කරන ලද නිර්දේශ 9ක් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම විසින් "බොහෝ දුරට අනුකූල" මට්ටම දක්වා ඉහළ නංවන ලදී. මේ අනුව, "අනුකූල"/ "බොහෝ දුරට අනුකූල" නිර්දේශ සංඛ්‍යාව 21ක් දක්වා වැඩි වී ඇත.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සඵලතාවය (Effectiveness) සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය ඇගයීම සඳහා මූල්‍ය කාර්ය සාධක බලකායේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ සමාලෝචන කණ්ඩායම (International Cooperation Review Group – ICRG) විසින් ශ්‍රී ලංකාව සමාලෝචනයට ලක් කරන බව 2016 ඔක්තෝම්බර් මාසයේදී මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දෙන ලදී. සාකච්ඡා සහ ප්‍රගති සමාලෝචන වාර්තාවන් කිහිපයකට පසුව ජාත්‍යන්තර සහයෝගීතාව, අධීක්ෂණය, නෛතිකමය පුද්ගලයන් හා සැකසුම් සහ න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉලක්ක ගත මූල්‍ය සම්බාධක (උතුරු කොරියාව සහ ඉරානයට අදාල) ආදී වශයෙන් වන කරුණු 4ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අවශ්‍ය ප්‍රගතිය පෙන්වා නොමැති බව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් ශ්‍රී ලංකාවට දැනුම් දී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේදී ආර්ජන්ටිනාවේ බුවනෝස් අයර්ස්හිදී පැවති වාර්ෂික රැස්වීමේදී, ශ්‍රී ලංකාව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමෝපායන්ගේ දුර්වලතා සහිත රටක් ලෙස මූල්‍ය කාර්ය සාධක බලකායේ අනුකූලතා ලේඛනයෙහි ලැයිස්තුගත කරන ලද අතර මෙය "අළු ලේඛනයට" ඇතුලත් කිරීම ලෙස හඳුන්වයි. මෙසේ ලැයිස්තුගත කිරීමෙන් පසුව, එම හඳුනාගත් ක්‍රමෝපාය දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා කාල රාමුවකට යටත්වූ ක්‍රියාකාරී සැලැස්මක් ශ්‍රී ලංකාවට ලබාදෙන ලදී. 2017 නොවැම්බර් මාසයේ සිදුවූ මෙම ලැයිස්තුගත වීමෙන් පසුව, මුදල් විශුද්ධිකරණ වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව දක්වන අනුකූලතාවය වර්ධනය කිරීමට ශ්‍රී ලංකාවේ නිසි අධිකාරීන් විසින් 2018 අංක 1 දරන මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන්වලට අදාල (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති නිකුත් කිරීම, න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය සම්බන්ධව උතුරු කොරියාවට අදාලව ඉලක්කගත මූල්‍ය සම්බාධක පිළිබඳ නියාමනයන් නිකුත් කිරීම ආදී පියවර රැසක් ගෙන ඇත.

තවද, අධිකරණ අමාත්‍යාංශය විසින් භාර ආඥා පනතට සහ 2002 අංක 25 දරන සාපරාධි කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනත සඳහා සංශෝධන හඳුන්වාදීම, සමාගම් රෙජිස්ට්‍රාර් විසින් 2007 අංක 7 දරන සමාගම් පනතට සංශෝධන හඳුන්වා දීම, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් න්‍යෂ්ටික අවි ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඉරානයට අදාලව ඉලක්කගත මූල්‍ය සම්බාධක පැනවීම සහ ක්‍රියාවට නැංවීම, නිසි බලධරයන් විසින් උතුරු කොරියාව සම්බන්ධව නියාමන ක්‍රියාත්මක කිරීම, මූල්‍ය බුද්ධි ඒකකය විසින් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් වෙත අවදානම පදනම් කරගත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දීම ආදී වූ පියවර රැසක් ගෙන ඇත. මීට අමතරව, මේ වන විට මූල්‍ය බුද්ධි ඒකකයේ ක්‍රියාත්මක වන අධීක්ෂණ කණ්ඩායමට වැඩි කාර්ය මණ්ඩලයක් වෙන් කිරීම හරහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ මූල්‍ය බුද්ධි ඒකක අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.

මූල්‍ය කාර්ය සාධක බලකායේ ක්‍රියාකාරී සැලැස්ම සැලකිල්ලට ගෙන මූල්‍ය බුද්ධි ඒකකයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති සම්පාදකයා ලෙස කටයුතු කරනු ලබන ජාතික සහයෝගීතා කමිටුව විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුතීන් වැඩිදියුණු කිරීම සඳහා අදාල වන රටෙහි සියලුම පාර්ශ්වයන්ගේ කැපවීම සහ සහයෝගීතාවය වර්ධනය කිරීමට අවශ්‍ය නිසි පියවර ගෙන ඇත. එබැවින්, ශ්‍රී ලංකාව වෙත ලබා දී ඇති ක්‍රියාකාරී සැලැස්ම, ලබාදී ඇති කාලය තුලදී සාර්ථක අයුරින් සම්පූර්ණ කර රටේ අනුකූලතාවය මෙන්ම ශ්‍රේණිගත කිරීමද ඉහළ නංවා ගැනීමට හැකිවනු ඇති බව අපගේ විශ්වාසයයි.